## වෘත්තීය තරු අනුව වර්ග කිරීම් පරීක්ෂණය

ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් නිත්‍ය ඒකක සෙනින් වෙනුවෙන් පවත්වනු ලබන වෘත්තීය/තරු අනුව පරීක්ෂණ පැවැත්වීමේ පිළිවෙත හවනි 4/66 ට අනුව සිදුකරනු ලැබේ. මෙම ක්‍රියා පිළිවෙත යුද හමුදාවේ අවශ්‍යතාවය මත සෑම අවුරුදු 04කට වරක්ම සමාලෝචනය කර සංශෝධනය කල හැක. යුධ හමුදාවට සෙනින් බඳවා ගැනීමේදී සිවිල් වෘත්තිය පළපුරුදුකම් ඇති අය යුද හමුදා වෘත්තීන්ට ඉඳුරාම බඳවාගනු ලබන අතර, සිවිල් වෘත්තිය පුහුණුවක් නොමැති අයවලුන් ආධුනිකයින් ලෙස බඳවා ගෙන වෘත්තියකට ඇතුලත් කර වෘත්තිය පුහුණුවක් ලබාදීමෙන් හෝ තරු අනුව වර්ග කිරීමේ පරීක්ෂණයකට භාජනය කර වර්ග කරනු ලැබේ.

**<u>වෘත්තිය අනුව වර්ග කිරීම</u>**

යුධ හමුදාවේ ඇති වෘත්තින් ඝණ වශයෙන් කොටස් 04 කට හා වෘත්තිය ප්‍රගතියක් ලබාදීමේ අදහසින් පංති 03කට බෙදා වෙන් කරනු ලැබේ.

අ. ඝණ වශයෙන්:
- (1) විශේෂ ඝණය
- (2) 1 වන ඝණය
- (3) 2 වන ඝණය
- (4) 3 වන ඝණය

ආ. පංති වශයෙන්:
- (1) 111 වන පංතිය
- (2) 11 වන පංතිය
- (3) 1 වන පංතිය

යම් සෙනියෙකු 111 වන පංතියේ වෘත්තිය පරීක්ෂණයෙන් සමත් වූ පසු වෘත්තියේ " මස්ටර්" (වෘත්තියගත කිරීම) කරනු ලබන අතර, දෙවන හා පළවන පංතින්ගෙන් සමත් වීමෙන් පසු සිදුකරනුයේ අදාල වෘත්තියේ උසස් කිරීමකි. ඉඳුරාම වෘත්තියකට බඳවාගත් අයෙකු හෝ පසු කාලයේ වෘත්තියක් සඳහා විශේෂ නිපුණතාවයක් ලැබූ අයෙකු පිපඅම අනුමැතිය ඇතිව 111 වන ශ්‍රේණියේ වෘත්තිය පරීක්ෂණයට භාජනය නොකර ඉහල ශ්‍රේණියකදී වෘත්තිය මස්ටර් කල හැක.

**<u>වෘත්තිය පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම්:</u>**

අ. 111 වන පංතිය:

| | | | |
|---|---|---|---|
| (1) | සේවා කාලය | - | ආධුනික පුහුණු කාලය හැර මාස 06 |
| (2) | හමුදා චරිතය | - | අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි. |
| (3) | අනිගේ සහතිකය | - | පෙනී සිටිනු ලබන වෘත්තියට අදාල දැනුමක් ඇති බවට සහතික කල යුතුයි. |
| (4) | අවි නිපුණතාවය | - | ඒකකයට ආවේණික අවියෙන් නිපුණතාවය ලබා තිබිය යුතුයි. |

අ. 11 වන පංතිය:

| | | | |
|---|---|---|---|
| (1) | සේවා කාලය | - | 111 වන පංතිය සමත්වූ දින සිට මාස 12 |
| (2) | හමුදා චරිතය | - | අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි. |
| (3) | අනිගේ සහතිකය | - | පෙනී සිටිනු ලබන වෘත්තියට අදාල දැනුමක් ඇති බවට සහතික කල යුතුයි. |

(4) අවි නිපුණතාවය - ඒකකයට ආවේණික අවියෙන් නිපුණතාවය ලබා තිබිය යුතුයි.

අ. 1 වන පංතිය:

(1) සේවා කාලය - 11 වන පංතිය සමත්වූ දින සිට මාස 18

(2) හමුදා චරිතය - අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි.

(3) අනිගේ සහතිකය - පෙනී සිටිනු ලබන වෘත්තියට අදාල දැනුමක් ඇති බවට සහතික කල යුතුයි.

(4) අවි නිපුණතාවය - ඒකකයට ආවේණික අවියෙන් නිපුණතාවය ලබා තිබිය යුතුයි.

**වෘත්තිය පරීක්ෂණ පැවැත්විය යුතු අවස්ථා:**

අ. ඛණ්ඩ සේවයකින් පසු සමහර අවස්ථාවන්හිදී නැවත යුද හමුදාවට බඳවා ගැනීමේදී.

ආ. සේවයෙන් පැනයාමේ චෝදනාවකට වරදකරු වූ විට.

ඇ. වෘත්තියේ අදක්ෂතාවය මත නිළයන් පහත හෙලූ විට.

ඈ. වෙනත් ඒකකයක වෙනත් වෘත්තියක් සඳහා අන්තර් ඒකක මාරුවූ විට.

ඉ. හැකියාව උසස් තත්වයකට ගත යුතු යැයි හමුදා නියෝග ප්‍රතිසංශෝධනය කල විට.

ඊ. වෘත්තියක් නොමැතිව සිට වෘත්තියකට ඇතුලත් කිරීමේදී.

උ. ලබා ඇති පංතියට අනුව වෘත්තියට අදාල දැනුමක් නොමැතිවූ විට.

ඌ. කායික දුබලතාවයක් මත තමා ලග ඇති පංතියට අවශ්‍ය දැනුම ආරක්ෂා කර ගැනීමට නොහැකි වූ විට.

**<u>වෘත්තිය පරීක්ෂණ මණ්ඩල පත්කිරීම</u>**

වෘත්තිය පරීක්ෂණයන් අවුරුද්දකට මාර්තු මස 1 දිනට හා සැප්තැම්බර් මස දෙවන දිනට ප්‍රථම වශයෙන් අවුරුද්දකට දෙවරක් පැවැත්විය යුතුයි. භකාස අණසක ආඥාපති විසින් තම අණසක යටතේ ඇති ඒකකයන්ට විශේෂ වූ වෘත්තින් සඳහා වන පරීක්ෂණ මණ්ඩල පත්කරනු ලබන අතර, සියලු සේනාංක සඳහා පොදුවූ වෘත්තින් වෙනුවෙන් වෘත්තිය පරීක්ෂණ මණ්ඩල පිපඅම වෙතින් පත්කරනු ලැබේ.

**<u>පරීක්ෂණ පැවැත්විය යුතු ආකාරය:</u>**

සෑම වෘත්තිය පරීක්ෂණයක්ම ලිඛිත හා ප්‍රායෝගික වශයෙන් කොටස් 02කින් සමන්විතව පැවැත්විය යුතු අතර, ප්‍රශ්ණ පත්‍ර සකස් කිරීමේදී සියලුම පංති සඳහා එක් ප්‍රශ්ණ පත්‍රයක් හෝ එක් එක් පංතියට වෙන් වෙන් වශයෙන් ප්‍රශ්ණ පත්‍ර පිළියෙල කල හැක. එසේ ප්‍රශ්ණ පත්‍ර පිළියෙල කිරීමේදී එක් එක් පරීක්ෂණයෙන් සමත්වීම සඳහා පහත දක්වා ඇති අයුරු ලකුණු ලබාගත යුතුවේ.

අ. පංති තුන වෙනුවෙන් එක් ප්‍රශ්ණ පත්‍රයක් පිළියෙල කල විට:

111 වන පංතිය සඳහා - 50%

11 වන පංතිය සඳහා - 65%

1 වන පංතිය සඳහා - 80%

ආ. පංති තුන වෙනුවෙන් වෙන් වෙන්ව ප්‍රශ්ණ පත්‍රයක් පිළියෙල කරන විට.

111 වන පංතිය සඳහා - 50%

11 වන පංතිය සඳහා - 55%

1 වන පංතිය සඳහා - 60%

**කාර්යාලීය පිලිවෙත:**

ඒ ඒ පංතීන් සඳහා මෙහි පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගේ නාමලේඛණයක් සමගින් විහනි 4/66 උපග්‍රන්ථ බී තෙපිටපතකින් සකසා අනි සහතික කිරීමෙන් පසු වෘත්තිය පරීක්ෂණ මණ්ඩල සභාපති වෙත ඉදිරිපත් කල යුතුවේ. සභාපති විසින් පහසු දිනයක පහසු ස්ථානයක පරීක්ෂණ පවත්වා සමත් අයවලුන් වෙනුවෙන් පමණක් යුආපා 15 තෙපිටපතකින් සකසා මණ්ඩල වාර්ථාව සමග ආඥා මූලස්ථානය (හකාස අණසක) වෙත ඉදිරිපත් කරනු ලැබේ. ආඥාපති සහතික කිරීමෙන් පසු යුආපා 15 පිටපත් 02 ක්ද විහනි 4/66 උපග්‍රන්ථ බී පිටපත් 02 ක්ද පරීක්ෂණයෙන් සමත් සෙනී අයත් ඒකකයන් වෙත එවනු ලැබේ. ඒ අනුව ඒකකය විසින් යුආපා 09 සකසා යුආපා 15 මුල් පිටපත සහ විහනි 4/66 උපග්‍රන්ථ බී මුල් පිටපත වැහාලේඅම වෙත යවනු ලැබේ. ඉතිරි පිටපත් සෙනියාගේ පුද්ගලික ලිපිගොනුවේ තැම්පත් කරනු ලැබේ.

**තරු අනුව වර්ග කිරීම්**

වෘත්තින්ට අයත් නොවන සෙනින් සඳහා ඔවුන්ට හිමි රාජකාරියේ කාර්යක්ෂමතාවය ආරක්ෂා කර ගැනීමට තරු අනුව වර්ග කිරීම සිදුකරනු ලැබේ. මෙය පළවන තරුවේ සිට තුන්වන තරුව දක්වා වූ අනුපිළිවෙලින් සමන්විත වේ. මෙම පරීක්ෂණ එක් එක් ඒකකයන්ට වෙන් වෙන්ව පැවැත්විය යුතු අතර, ඒකකයට විශේෂ වූ රාජකාරින් හි නිපුණතාවය දැක්විය යුතුය.

එක් එක් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම්:

අ. පළමුවන තරුව:

| | | |
|---|---|---|
| සේවා කාලය | - | බැඳුණු දින සිට මාස 06 |
| හමුදා චරිතය | - | අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි. |
| අනිගේ චරිතය | - | සේවා කාලය සුදුසු අයුරින් හමුදා දැනුමක් ලබා තිබීම. |

ආ. දෙවන තරුව:

| | | |
|---|---|---|
| සේවා කාලය | - | බැඳුණු දින සිට මාස 18 |
| හමුදා චරිතය | - | අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි. |
| අනිගේ චරිතය | - | පුහුණුව ලත් සෙබළෙකු වශයෙන් ඒකකයේ රාජකාරි කිරීමේ හැකියාව |

ඇ. තුන්වන තරුව:

| | | |
|---|---|---|
| සේවා කාලය | - | බැඳුණු දින සිට අවුරුදු 03 |
| හමුදා චරිතය | - | අනි විසින් සතුටුදායක යැයි සලකනු ලබන තත්වයක සිටිය යුතුයි. |
| අනිගේ චරිතය | - | සේනාංකයේ රාජකාරි සම්බන්ධයෙන් මනා දැනුමක් ලබා තිබීම |

පහත සඳහන් අවස්ථාවන් හිදී සෙනින්ගේ ප්‍රවීණතාවය සේනාංකයට අවශ්‍ය අයුරින් තබා ගැනීම සඳහා සෙසුනිලයන් නැවත පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

අ. මාස 06 කට වැඩි කාලයක් නිත්‍ය උපසේවයේ සිට නිත්‍ය සේවයට කැඳවූ විට.

ආ. හමුදාවෙන් පැනයාමේ චෝදනාව මත

ඇ. සැරයන් හෝ ඊට උසස් නිළයක සිට නිළ පහත හෙළීමකදී.

ඈ. අන්තර් ඒකක මාරුවීම් වලදී.

ඉ. අකාර්යක්ෂමතාවය නිසා සැරයන් නිළයට පහල අයවලුන්ගේ නිළ පහත හෙළීමකදී.

**<u>පරීක්ෂණ මණ්ඩල පත්කිරීම</u>**

මෙම පරීක්ෂණ මණ්ඩලය ඒකක අනි විසින් පත්කරනු ලබන අතර, පහත සඳහන් අයුරින් සමන්විත විය යුතුය.

| | | |
|---|---|---|
| අ. | සභාපති | - මේජර්/කපිතන් නිළයේ අයෙකු |
| ආ. | සාමාජික | - නිළධාරියෙකු/බලලත් නිළධාරියෙකු, ජේ්‍යකොනොනියෙකු |
| ඇ. | සාමාජික | - විශේෂ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සුදුසු නිළධාරියෙකු |

**<u>කාර්යාල ක්‍රියා පිළිවෙතඃ</u>**

මණ්ඩලය විසින් නියමිත කාලසීමාව තුලදී ඒකක මූලස්ථානය වෙතින් පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන අයවලුන් හට පරීක්ෂණ පවත්වා සමත් අයවලුන් වෙනුවෙන් පමණක් යුආපා 38 දෙපිටපතකින් සකසා මණ්ඩල වාර්ථාව සමගින් ඒකක මූලස්ථානයට භාරදෙනු ලැබේ. එම මණ්ඩල වාර්ථාව අනි සහතික කිරීමෙන් පසු මූලස්ථාන කාර්යාලය මගින් යුආපා 38 මුල් පිටපත යුආපා 09 සමග වැහාලේඅම වෙතද ඉතිරි පිටපත සෙනියාගේ පුද්ගලික ලිපිගොනුවේද තැන්පත් කරනු ලැබේ.